# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,284 — 1965 ජනවාරි 6 වැනි බදාදා — 1965.1.6

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## ආණ්ඩුවේ නිවේදන

### පාර්ලිමේන්තු මහා මැතිවරණය—1965

**අළුත් මැතිවරණ නීති**

**පොදු දැනගැනීම පිණිසයි**

දූෂණ සහ නීතිවිරෝධි ක්‍රියා ආදි දඩුවම් ලැබිය හැකි මැතිවරණ වරදවල් සම්බන්ධයෙන්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ ප්‍රතිපාදනයන්ට ලඟදී කරන ලද සංශෝධනයන් සමහරකට අදල උපුටනයන්, මහජනයාගේ දේශපාලන පක්ෂවල අපේක්ෂකයන්ගේ සහ මැතිවරණ නියෝජිතවරුන්ගේ දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි.

2. මෙම ගැසට් පත්‍රයේ පිටපත් එක් එක් තේරීම්භාර නිලධාරි කාර්යාලයේ, ප්‍රාදේශීය බලමණ්ඩල කාර්යාලයේ, ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලයේ, තැපැල් කාර්යාලයේ, පොලිස් ස්ථානයේ, ග්‍රාමසේවක කාර්යාලයේ සහ මෙම කාර්යාලයේ ප්‍රදර්ශණය කරනු ලැබේ.

3. මෙහි පිටපත් නාමයෝජනා දිනයේ දී අපේක්ෂකයන්ට ද නිකුත් කරනු ලැබේ. මෙහි පහත උපුටා දක්වා ඇති ප්‍රතිපාදනයන් විමසා බැලීමට කැමති කෙනෙක් හෝ ඒ ගැන සැලකිලිමත්වන යම්කිසි පක්ෂයක් වේනම්, ඔවුන් විසින් ඉහතකී ස්ථානවලදී විමසා බැලීම හෝ මෙම කාර්යාලයට ලියා විමසීම හෝ කළ හැක.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්.

මැතිවරණ කොමසාරිස් කාර්යාලය,
අංක 33, හෝර්ටන් පෙදෙස,
තැ. පෙ. අංක 814,
කොළඹ 7, 1965 ජනවාරි 5 දින.

**යොමුකර ඇති වගන්ති**

**නිල ඡන්ද දැන්වීම් පතක් නීති විරෝධී ලෙස ළඟ තබා ගැනීම**

**35අ(3) වැනි වගන්තිය.**—"(3) රජයේ සේවකයකු වශයෙන් තමාගේ රාජකාරි කරන අතරතුර දී එබඳු රජයේ සේවකයකු හැර, වෙනත් යම් තැනැත්තකු විසින් වෙන තැනැත්තකුගේ නිල ඡන්ද දැන්වීම් පතක් තමා ළඟ තබාගත හොත්, ඒ තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරුවීමේදී රුපියල් සියයකට වැඩි නොවූ දඩයකට හෝ මසකට වැඩි නොවූ කාලයක් හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය".

**තැපෑලෙන් ඡන්දය දීම—වරදවල්**

**තැපෑලෙන් ඡන්දය දීම.**—42 අ. (1) යම් මැතිවරණ දිස්ත්‍රික්කයක යම් මැතිවරණයක කාර්යය සඳහා මේ වගන්තිය යටතේ තැපැල් ඡන්දදායකයෙකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලැබූ තැනැත්තෙකු විසින් තැපෑලෙන් ඡන්දය දිය හැකි අතර ඒ මැතිවරණයෙහි දී පෞද්ගලික ව ඡන්දය නොදිය යුතුය.

මේ උප වගන්තියේ ඉහතින් වූ විධිවිධාන කඩකරමින් යම් මැතිවරණයක දී පුද්ගලික ව ඡන්දය දෙන යම් තැනැත්තකු, වරදකට වරදකරු විය යුතු අතර සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු වීමේ දී රුපියල් පන්සියයකට වැඩි නොවූ දඩයකට හෝ එක් අවුරුද්දකට නො වැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකටම යටත් විය යුතුය.

**වරදවල්**

**52 වැනි වගන්තිය.**—(1) (අ) යම් නාම යෝජනා පත්‍රයක හොර අත්සන් තබන හෝ එය වාංචනික ලෙස මකා දමන හෝ වාංචනික ලෙස විනාශ කරන හෝ හොර අත්සන් තැබූවක් බව දැනුවත්ව ම යම් නාම යෝජනා පත්‍රයක් තේරීම් භාර නිලධාරියාහට භාර දෙන, නැතහොත්

(ආ) යම් කායඞාලයීය අඳුනා ගැනීම් පත්‍රයක හෝ ඡන්ද පත්‍රිකාවක හොර අත්සන් තබන හෝ ව්‍යාජ අනුකරණයක් කරන හෝ වාංචනික ලෙස එය මකා දමන හෝ විනාශ කරන හෝ යම් ඡන්ද පත්‍රිකාවක වූ නිල ලකුණ කූට ලකුණක් කරන හෝ වාංචනික ලෙස මකා දමන හෝ වාංචනික ලෙස විනාශ කරන, නැතහොත්

(ඇ) නිසි බලය නොමැති ව යම් කායඞාලයීය අඳුනාගැනීම් පත්‍රයක් හෝ ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තෙකු වෙත සපයන, නැතහොත්

### පෝස්ටර් දැන්වීම් සහ අත් දැන්වීම් ආදිය ප්‍රදර්ශනය කිරීම

52ආ වැනි වගන්තිය.—"(1) යම් මැතිවරණයක දී නාම යෝජනා පත්‍ර භාර ගන්නා දිනයෙහි ආරම්භ වන හා ඒ මැතිවරණය සම්බන්ධයෙන් ඡන්ද විමසීමේ දිනයට ඉක්බිති දිනයෙන් අවසාන වන කාල සීමාව තුළ ඒ මැතිවරණයෙහි දී යම් අපෙක්ෂකයකු තෝරා ගැනීමේ ඉඩ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා කිසි ම තැනැත්තකු විසින්—

(අ) ඒ මැතිවරණයේ දී එහි අපෙක්ෂකයකු හෝ ඔහුගේ ඡන්ද නියෝජිතයා ගෙන යෑම සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක් තුළ හෝ වාහනයක හැර පොදු හෝ පෞද්ගලික කිසි ම ස්ථානයක යම් කොඩියක් හෝ පතාකයක් ; හෝ

(ආ) ඒ මැතිවරණයෙහි දී එහි අපෙක්ෂකයකුට ආධාර වශයෙන් යම් ස්ථානයක රැස්වීමක් පැවැත්වීමට ඇති යම් දිනයක ඒ ස්ථානය තුළ හෝ ඒ ස්ථානයෙහි හැර මහජනයාට යාමට අයිතියක් ඇති හෝ ඉඩ දී ඇති යම් ස්ථානයක යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශණ පත්‍රයක්, දැන්වීම් කොළයක්, දැන්වීමක් හෝ ලකුණක් ; හෝ

(ඇ) යම් මහා මාර්ගයක් මත හෝ හරහා යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, දැන්වීමක්, ලකුණක්, කොඩියක් හෝ පතාකයක් ; හෝ

(ඈ) ඒ මැතිවරණයේ දී එහි අපෙක්ෂකයකු හෝ ඔහුගේ ඡන්ද නියෝජිතයා ගෙන යෑම සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක් තුළ හෝ වාහනයක හැර යම් වාහනයක් තුල හෝ වාහනයක යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීමක් හෝ ලකුණක්,

ප්‍රදර්ශණය නො කළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) වෙනි උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් සියයකට වැඩි නොවූ දඩයකට හෝ මාසයකට වැඩි නො වූ කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

(3) මේ වගන්තියෙහි නිශ්චය කොට දක්වන ලද වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකු ම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ සෑම වරදක් ම අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථය ඇතුළත සංඥෙය වරදක් විය යුතුය.

(5) මේ වගන්තියේ (1) වෙනි උපවගන්තියේ විධිවිධානවල වූ යම් උල්ලංඝනය කිරීමක් වැළැක්වීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ක්‍රියා පිළිවෙලක් හා බලපෑමක් යම් පොලිස් නිලධරයකු විසින් යෙදීම කළ හැකි අතර ඒ උල්ලංඝනය කිරීම සඳහා පාවිච්චි කරන ලද යම් උපකරණයක් තහනමට ගත හැකි අතර එසේ උල්ලංඝනය කොට පාවිච්චි කරන ලද යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොලයක්, දැන්වීමක්, සංඥවක්, ධජයක් හෝ පතාකයක් තහනමට ගැනීම හා ඉවත් කිරීමක් කළ හැකි ය.

### හොර ඡන්ද දීම සහ ඊට නියමිත දඬුවම්

54 වැනි වගන්තිය.—(1) යම් මැතිවරණයක දී—

(අ) ජීවත් ව සිටින හෝ මිය ගොස් ඇති හෝ ව්‍යාජ වූ වෙන යම් තැනැත්තකු වශයෙන් පුද්ගලික ව හෝ තැපැලෙන් ඡන්දය දෙන ; හෝ

(ආ) ඒ මැතිවරණයෙහි දී තමාගේ නමින් හෝ නම යටතේ එක් වරකට වඩා ඡන්දය දෙන

සෑම තැනැත්තකු අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි අර්ථය ඇතුළත සංඥෙය වරදක් විය යුතු හොර ඡන්ද දීමේ වරදට වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තියෙහි කාර්යයන් සඳහා—

(අ) පුද්ගලිකව ඡන්දය දීමේ කාර්යය සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලුම් කොට ඇති; හෝ

(ආ) තැපැල් ඡන්දදයකයකු සේ සලකනු ලැබීමට ඉල්ලීමක් කර ඇති; හෝ

(ඇ) තැපැලෙන් ඡන්දය දීමේ කාර්‍ය්‍ය සඳහා නිකුත් කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් වලංගු ලෙස හෝ නො එ සේ ව ලකුණු කොට එවා ඇති තැනැත්තකු, ඡන්දය දී ඇති ලෙස සැලකිය යුතු යි.

58 වැනි වගන්තිය.—(1) (අ) හොර ඡන්ද දීමෙන් වරද කරන හෝ හොර ඡන්ද දීමේ වරද කිරීමට ආධාර කරන, අනුබල දෙන, උපදෙස් දෙන හෝ ඒ වරද කිරීමට වග බලා ගන්නා සෑම තැනැත්තකුම,

(ආ) ..............................................................................................................................

(ඇ) ..............................................................................................................................

(ඈ) ..............................................................................................................................

දූෂණ ක්‍රියාවකට වරදකරු විය යුතු අතර, ප්‍රාදේශීය අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ කල්හි, මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් අවස්ථාවක නම්, දෙලොස් මසකට වැඩි නොවූ කාලයක බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමකට යටත් විය යුතුය.

(2) දූෂණ ක්‍රියාවකට වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම තමා වරදකරු කරනු ලැබූ දින සිට හත් අවුරුදු කාල සීමාවක් ඡන්ද හිමියකු ලෙස ලියා පදිංචි වීමට හෝ මේ ආඥව යටතේ යම් මැතිවරණයක දී ඡන්දය දීමට හෝ උත්තර මන්ත්‍රීවරයකු හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරා ගනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට අයෝග්‍ය විය යුතු අතර ඒ දිනයෙහි දී උත්තර මන්ත්‍රීවරයකු ලෙස හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරා ගනු ලැබ හෝ පත් කරනු ලැබ සිටියහොත් ඔහුගේ තේරීම හෝ පත්වීම ඒ වරදකරු කරනු ලැබීමේ දින සිට අත්හල යුතු ය.

### අයුතු බලපෑම

56 වැනි වගන්තිය.—(1) යම් මැතිවරණයක දී යම් තැනැත්තකුගේ ඡන්දය දීමට හෝ දීමෙන් වැළකීමට ඒ තැනැත්තා පොළඹවීම හෝ ඔහුට බල කිරීම සඳහා නැතහොත් ඒ තැනැත්තා යම් මැතිවරණයක දී ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන නියම ලෙස හෝ අනියම් ලෙස තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙන යම් තැනැත්තකුගේ මාර්ගයෙන් ඒ තැනැත්තාට යම් බලපෑමක්, සාහසික කමක් හෝ අවහිරයක් කරන හෝ කරන බවට තර්ජනය කරන නැතහොත් තමා විසින් ම හෝ වෙන යම් තැනැත්තකු මගින් ඔහුට යම් ලෞකික හෝ අධ්‍යාත්මික පීඩාවක්, පාඩුවක්, හානියක් හෝ අලාභයක් කරන නැතහොත් පැහැරගෙන යාමෙන් ආසේධ කිරීමෙන් හෝ යම් වංචනික ක්‍රමයකින් හෝ උපක්‍රමයකින් යම් ඡන්ද හිමියකු තම ඡන්ද බලය නිදහස් ලෙස පාවිච්චි කිරීමට බාධා පමුණුවන හෝ එ සේ කිරීම වලකාලන නැතහොත් යම් මැතිවරණයක දී යම් ඡන්ද හිමියකුගේ ඡන්දය දීමට හෝ දීමෙන් වැළකීමට එ මගින් බල කරන, පොළඹවන හෝ කැමති කරවන සෑම තැනැත්තකු ම අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(2) යම් මැතිවරණයක නාම යෝජනා කිරීමේ දිනයෙන් පටන්ගෙන ඒ මැතිවරණයෙහි ඡන්ද විමසීමේ දිනයට පසු දින අවසන් වන කාල සීමාව තුළ යම් කාලයක දී—

(අ) ඒ මැතිවරණයේ ප්‍රතිඵලය වෙනස් අතකට හැරවීමේ කාර්‍ය්‍ය සඳහා හෝ ඒ මැතිවරණයෙහි දී යම් අපෙක්ෂකයකුට ඡන්දය දෙන ලෙස හෝ දීමෙන් වලකින ලෙස යම් ඡන්දහිමියකු පොළඹවීමේ කාර්යය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් වචන පවසන, නැතහොත්

(ආ) ඒ කාර්යය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොලයක්, දැන්වීමක්, සලකුණක්, ධජයක් හෝ පතාකයක්, නැතහොත්

(ඇ) ඒ මැතිවරණයෙහි දී යම් අපේක්ෂකයකු තෝරා ගැනීමේ ඉඩ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් පවත් වන හෝ පැවැත් වීමට සලස්වන

සෑම තැනැත්තකු ම අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

"(3) ආගමික සංස්ථාවක හෝ සංවිධානයක යම් සාමාජිකයෙක් හෝ නිලධරයෙක් ඒ සංස්ථාවෙහි හෝ සංවිධානයෙහි සාමාජිකයෙකු හෝ භක්තිකයෙකු යම් මැතිවරණයක දී යම් අපේක්ෂකයෙකුට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළැක්වීමට හෝ ඒ මැතිවරණයේ දී යම් දේශපාලන පක්ෂයකට ආධාර දීමට හෝ ආධාර දීමෙන් වැළැක්වීමට පෙළඹවීම සඳහා හෝ ඔහුට බල කිරීම සඳහා, නොහොත් ඒ සාමාජිකයා හෝ භක්තිකයා ඒ මැතිවරණයේ දී අපේක්ෂකයකුට ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකීම නිසා, නැතහොත් ඔහු ඒ මැතිවරණයේ දී යම් දේශපාලන පක්ෂයකට ආධාර දී තිබීම හෝ ආධාර දීමෙන් වැළකීම නිසා—

(අ) ඒ සාමාජිකයාට හෝ භක්තිකයාට හෝ ඒ සාමාජිකයාගේ හෝ භක්තිකයාගේ පවුලේ යම් කෙනෙකුට, සාමාන්‍යයෙන් ඒ සාමාජිකයාට හිමිකම් ලැබෙන්නට තුබුණු යම් අධ්‍යාත්මික සේවයක්, මෙහෙයක් හෝ ප්‍රතිලාභයක් ප්‍රතික්ෂේප කරයි නම් හෝ ප්‍රතික්ෂේප කිරීමට තර්ජනය කරයි නම් ; හෝ

(ආ) ඒ සාමාජිකයා හෝ භක්තිකයා ඒ සංස්ථාවෙන් හෝ සංවිධානයේ බැහැර කරයි නම් හෝ බැහැර කිරීමට තර්ජනය කරයි නම්, ඒ සාමාජිකයා හෝ නිලධරයා අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(4) අන් කිසි තැනැත්තකුගේ සේවා යෝජකයකු වූ යම් තැනැත්තෙක් ඒ අන් තැනැත්තා යම් මැතිවරණයක දී යම් අපෙක්ෂකයකුට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළැක්වීමට හෝ ඒ මැතිවරණයේ දී යම් දේශපාලන පක්ෂයකට ආධාර දීමට හෝ ආධාර දීමෙන් වැළැක්වීමට පෙළඹවීම හෝ ඔහුට බල කිරීම සඳහා නොහොත් ඒ අන් තැනැත්තා ඒ මැතිවරණයේ දී අපෙක්ෂකයකුට ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකීම නිසා, නැතහොත් ඔහු ඒ මැතිවරණයේ දී යම් දේශපාලන පක්ෂයකට ආධාර දී තිබීම හෝ ආධාර දීමෙන් වැළකීම නිසා—

(අ) ඒ අන් තැනැත්තා ඒ සේවයෙන් නවත්වයි නම් හෝ නැවැත්වීමට තර්ජනය කරයි නම් ; හෝ

(ආ) ඒ අන් තැනැත්තා ඒ සේවයෙහි දී සාමාන්‍යයෙන් එවකට භුක්ති විඳිමින් සිටි හෝ ඔහු විසින් භුක්ති විඳින්නට තුබුණු යම් ප්‍රතිලාභයක් හෝ සේවයක් ඒ අන් තැනැත්තාට ප්‍රතික්ෂේප කරයි නම් හෝ ප්‍රතික්ෂේප කිරීමට තර්ජනය කරයි නම්,

ඒ තැනැත්තා අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතුය."

## අල්ලස්

**57 වැනි වගන්තිය.**—පහත සඳහන් තැනැත්තන් අල්ලස් වරදට වරදකරුවන් ලෙස සැලකිය යුතුය :—

(අ) ඡන්දය දීමට හෝ දීමෙන් වැළකීමට යම් ඡන්දහිමියකු පොළඹවීම සඳහා තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙන යම් තැනැත්තකු මගින් යම් ඡන්දහිමියකුහට හෝ යම් ඡන්දහිමියකු වෙනුවෙන් යම් තැනැත්තකුහට හෝ වෙන යම් තැනැත්තකුහට නියම ලෙස හෝ අනියම් ලෙස යම් මුදලක් හෝ වටිනා ප්‍රතිස්ථාවක් දෙන, ණයට දෙන නැතහොත් දීමට හෝ ණයට දීමට එකඟ වන හෝ ඉදිරිපත් වන, පොරොන්දු වන නැතහොත් ලබාදීමට හෝ ලබාදීම පිණිස වැර වැඩීමට පොරොන්දු වන නැතහොත් මේ ආඥාව යටතේ යම් මැතිවරණයක දී ඒ ඡන්දහිමියා ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන ඉහත කී යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන සෑම තැනැත්තෙකුම ;

(ආ) ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකීමට යම් ඡන්දහිමියකු පොළඹවීම සඳහා තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙන යම් තැනැත්තෙකු මගින් ඒ ඡන්දහිමියාහට හෝ ඒ ඡන්දහිමියා වෙනුවෙන් යම් තැනැත්තකුහට හෝ වෙන යම් තැනැත්තකුහට නියම ලෙස හෝ අනියම් ලෙස, යම් නිලයක්, තනතුරක් හෝ රක්ෂාවක් දෙන, ලබා දෙන නැතහොත් දීමට හෝ ලබා දීමට එකඟවන හෝ ඉදිරිපත්වන, පොරොන්දු වන නැතහොත් ලබා දීමට හෝ ලබාදීම පිණිස වැර වැඩීමට පොරොන්දු වන නැතහොත් මේ ආඥාව යටතේ යම් මැතිවරණයකදී යම් ඡන්දහිමියකු ඡන්දය දී තිබීම හෝ දීමෙන් වැළකී සිටීම හේතු කොටගෙන ඉහතකී යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන සෑම තැනැත්තකුම ;

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස යම් තැනැත්තකුගේ වරණය හෝ මේ ආඥාව යටතේ යම් මැතිවරණයකදී යම් ඡන්දහිමියෙකුගේ ඡන්දය ලබාදීම සිදු කිරීමට හෝ සිදුකිරීමෙහිලා වැර වැඩීමට යම් තැනැත්තකු පොළඹවීම සඳහා තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙන යම් තැනැත්තෙකු මගින් ඒ තැනැත්තාට නියම ලෙස හෝ අනියම් ලෙස ඉහතකී යම් තෑග්ගක්, ණයක්, යෝජනාවක්, පොරොන්දුවක්, ලබාදීමක් හෝ ගිවිසුමක් ඉදිරිපත් කරන සෑම තැනැත්තකුම ;

(ඈ) එබඳු යම් තෑග්ගක්, ණයක්, යෝජනාවක්, පොරොන්දුවක් හෝ ගිවිසුමක් ලැබුණු කල්හි නැතහොත් එබඳු යම් තෑග්ගක, ණයක, යෝජනාවක හෝ ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස යම් තැනැත්තකුගේ වරණය හෝ මේ ආඥාව යටතේ යම් මැතිවරණයකදී යම් ඡන්දහිමියකුගේ ඡන්දය ලබාදීම, සිදුකරන හෝ සිදු කිරීමෙහි යෙදෙන සිදු කිරීමට පොරොන්දුවන නැතහොත් වැර වඩන සෑම තැනැත්තකු ම ;

(ඉ) මේ ආඥාව යටතේ යම් මැතිවරණයකදී අල්ලස් වශයෙන් යම් මුදලක් හෝ එහි යම් කොටසක් වියදම් කළ යුතුය යන චේතනාවෙන් වෙන යම් තැනැත්තකුහට හෝ වෙන යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය පිණිස ඒ මුදල කලින් ගෙවන, ගෙවන හෝ ගෙවීමට සලස්වන නැතහොත් එබඳු යම් මැතිවරණයකදී අල්ලස් වශයෙන් වියදම් කරන ලද යම් මුදලක් සම්පූර්ණයෙන්ම හෝ අඩක් නිදහස් කිරීම හෝ ආපසු ගෙවීම උදෙසා දනුවත්වම යම් තැනැත්තකුහට යම් මුදලක් ගෙවන හෝ ගෙවීමට සලස්වන සෑම තැනැත්තකු ම ;

(ඊ) මේ ආඥාව යටතේ යම් මැතිවරණයකට පෙර හෝ මැතිවරණයක් අතරතුරේ තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙන යම් තැනැත්තකු මගින් එබඳු යම් මැතිවරණයකදී ඡන්දය දීම හෝ ඡන්දය දීමට එකඟවීම නැතහොත් ඡන්දය දීමෙන් වැළකීම හෝ ඡන්දය දීමෙන් වැළකීමට එකඟවීම හේතුකොටගෙන ඡන්දය දීමෙන් වැළකීම හෝ ඡන්දය දීමෙන් වැළකීමට එකඟවීම හේතුකොට ගෙන තමාට ම හෝ වෙන යම් තැනැත්තකුහට නියම ලෙස හෝ අනියම් ලෙස හෝ යම් මුදලක්, තෑග්ගක්, ණයක් හෝ තනතුරක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක්, නිලයක්, හෝ රක්ෂාවක් ලබන ලැබීමට එකඟවන හෝ ඒ සඳහා ගිවිසුම් කරන සෑම ඡන්දහිමියකු ම ;

(උ) මේ ආඥාව යටතේ යම් මැතිවරණයකින් පසු, තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙන යම් තැනැත්තකු මගින් එබඳු යම් මැතිවරණයකදී යම් තැනැත්තකු ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම නැතහොත් ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකීමට වෙන යම් තැනැත්තකු පොළඹවා තිබීම හේතුකොට ගෙන තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙන යම් තැනැත්තකු මගින් නියම ලෙස හෝ අනියම් ලෙස යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් ලබන සෑම තැනැත්තකු ම ;

(ඌ) මැතිවරණයකදී යම් අපේක්ෂකයෙකුට ඡන්දය දීම හෝ ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමට එකඟ වීම හෝ ඡන්දය දීමට එකඟව සිටීම හේතුකොටගෙන ඒ සඳහා වූ ගෙවීමක් වශයෙන්, නැතහොත් මැතිවරණයකදී යම් අපේක්ෂකයකුට සහාය වී තිබීම හෝ සහාය වීමට එකඟ ව සිටීම හේතුකොට ගෙන, ඒ සඳහා වූ ගෙවීමක් වශයෙන් යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් තෑගි කරන ලෙස හෝ ණයට දෙන ලෙස නැතහොත් යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් තෑගි කිරීමට හෝ ණයට දීමට පොරොන්දු වන ලෙස නැතහොත් යම් නිලයක්, තනතුරක් හෝ රක්ෂාවක් ලබා දෙන ලෙස නැතහොත් යම් නිලයක්, තනතුරක් හෝ රක්ෂාවක් දීමට පොරොන්දු වන ලෙස ඒ අපේක්ෂකයා වෙත නැතහොත් ඔහුගේ නියෝජිතයා හෝ නියෝජිතයන් වෙත තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙන යම් තැනැත්තකු මගින් නියම ලෙස ඉල්ලුම් කරන සෑම තැනැත්තකු ම ; හා

(එ) අපේක්ෂකයකු ලෙස නාම යෝජනා ලැබීමට හෝ අපේක්ෂකයකු වීමෙන් වැළකීමට හෝ අපේක්ෂකයෙකු වී ඇතහොත් ඉල්ලා අස්වීමට එකඟ වන ලෙස වෙන යම් තැනැත්තකු පොළඹවීම සඳහා තමා විසින් ම හෝ තමා වෙනුවෙන් යම් තැනැත්තකු මගින් නියම ලෙස හෝ අනියම් ලෙස ඒ අනෙක් තැනැත්තාහට යම් නිලයක්, තනතුරක් හෝ රක්ෂාවක් දෙන හෝ ලබා දෙන නැතහොත් යම් නිලයක්, තනතුරක් හෝ රක්ෂාවක් දීමට හෝ ලබා දීමට එකඟ වන නැතහොත් ලබා දීමට හෝ ලබා දීමෙහි ලා වැර වැඩීමට ඉදිරිපත් වන හෝ පොරොන්දු වන නැතහොත් යම් තැනැත්තකුහට හෝ ඒ අනෙක් තැනැත්තාහට හෝ ඒ අනෙක් තැනැත්තා වෙනුවෙන් වෙන යම් තැනැත්තකුහට යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් දෙන හෝ ණයට දෙන නැතහොත් දීමට හෝ ණයට දීමට එකඟ වන නැතහොත් ලබා දීමට හෝ ලබා දීමෙහි ලා වැර වැඩීමට ඉදිරිපත් වන හෝ පොරොන්දු වන සෑම තැනැත්තකුම.

### සංග්‍රහ කිරීම, අයුතු බලපෑම සහ අල්ලස් ආදිය සඳහා දඩුවම්

**58 වැනි වගන්තිය.**—(1) (අ) ..............................

(ආ) සංග්‍රහ කිරීමේ, අයුතු බලපෑමේ හෝ අල්ලස් පිළිබඳ වරද කරණ ; නැතහොත්

(ඇ) යම් අපේක්ෂකයකු තෝරා ගැනීම වෙනස් කිරීමේ කාර්යය සඳහා ඒ අපේක්ෂකයාගේ පෞද්ගලික ජන්දය හෝ හැසිරීම සම්බන්ධයෙන් යම් අසත්‍ය කරුණු ප්‍රකාශයක් යම් මැතිවරණයකට පෙර හෝ යම් මැතිවරණයක් අතරතුරේ කරන හෝ ප්‍රසිද්ධ කරණ ; නැතහොත්

(ඉ) යම් අපේක්ෂකයකු තෝරා ගැනීමේ ඉඩ වැඩි දියුණු කිරීමේ හෝ තෝරා ගැනීම සිදු කිරීමේ කාර්යය සඳහා ඒ මැතිවරණයෙහි දී වෙන යම් අපේක්ෂකයකුගේ ඉල්ලා අස්වීම පිළිබඳව යම් අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ ප්‍රසිද්ධ කරන ;

සෑම තැනැත්තකු ම දූෂණ ක්‍රියාවකට වරදකරු විය යුතු අතර ප්‍රදේශ අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ කල්හි, මේ උපවගන්තියේ (අ) ඡෙදයෙහි සඳහන් අවස්ථාවක නම්, දොළොස් මසකට වැඩි නො වූ කාලයක බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට ද වෙන යම් අවස්ථාවක නම්, රුපියල් පන්සියයකට වැඩි නො වූ දඩයකට හෝ හමසකට වැඩි නොවූ කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා ඒ බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම ද යටත් විය යුතු ය.

(2) දූෂණ ක්‍රියාවකට වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම තමා වරදකරු කරනු ලැබූ දින සිට හත් අවුරුදු කාලසීමාවක් ජන්ද හිමියකු ලෙස ලියා පදිංචි වීමට හෝ මේ ආඥාව යටතේ යම් මැතිවරණයක දී ජන්දය දීමට හෝ උත්තර මන්ත්‍රීවරයකු හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරා ගනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට අයෝග්‍ය විය යුතු අතර ඒ දිනයෙහි දී උත්තර මන්ත්‍රීවරයකු ලෙස හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරා ගනු ලැබ හෝ පත් කරනු ලැබ සිටියහොත් ඔහුගේ තේරීම හෝ පත්වීම ඒ වරදකරු කරනු ලැබීමේ දින සිට අත්හල යුතු ය.

### ප්‍රවෘත්ති පත්‍රවල අසත්‍ය වාර්තා

**58අ වැනි වගන්තිය.**—(1) යම් ප්‍රවෘත්ති පත්‍රයක—

(අ) යම් මැතිවරණයක දී යම් අපේක්ෂකයකුගේ කථාවල් හෝ කටයුතු හෝ ඒ මැතිවරණය කරහ කරන මැතිවරණ කාර්යය සඳහා පිළිගත් පක්ෂයක් වූ හෝ නො වූ යම් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් හෝ පිළිබඳ ව ; හෝ

(ආ) ඒ අපේක්ෂකයා හෝ එබඳු යම් පක්ෂයක් විසින් ඒ මැතිවරණය පවත්වා ගෙන යාම හෝ එහි කටයුතු කිරීම සම්බන්ධයෙන්, හෝ පිළිබඳ ව යම් අසත්‍යය ප්‍රකාශයක් පළ කරනු ලැබූ සහ ඒ ප්‍රකාශය ඒ මැතිවරණයෙහි ප්‍රතිඵල කෙරෙහි බලපෑ හැකි වන අවස්ථාවක දී, එසේ එය පළකරනු ලැබූ කාලයෙහි ඒ ප්‍රවෘත්ති පත්‍රයෙහි අයිතිකරු, කළමනාකරු, සංස්කාරක, ප්‍රකාශක හෝ වෙනත් එවැනි නිලධරයකුව සිටි හෝ ඒ තනතුරෙහි ක්‍රියා කරන ලද යි සැලකෙන සෑම එක් එක් තැනැත්තකු, ඒ පළකිරීම කරන ලද්දේ තමාගේ අනුමතිය හෝ අනුදැනුම නොමැතිව බව සහ ඒ තනතුරෙහි තමාට අයත් කාර්යයන්ගේ ස්වභාවය ගැන සැලකිලිමත් ව තමා විසින් යෙදිය යුතු ව තිබුණු සියලු උද්‍යොගය ඒ පළ කිරීම වැළැක්වීමට සියළු ම අවස්ථාවන් යටතේ තමා විසින් යොදන ලද බව ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, නීති විරෝධි ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තියෙහි " ප්‍රවෘත්ති පත්‍රය " යන යෙදුමට යම් සංග්‍රහයක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ සෙසු ප්‍රකාශනයක් ඇතුළත් වේ.

### ජන්ද පොලකට හෝ ජන්ද පොලක සිට ජන්දදායකයන් එහා මෙහා ගෙනයාම, වරදවල් සහ දඩුවම්

**67 වැනි වගන්තිය.**—(3) ජන්දපොලට හෝ ජන්ද පොළොහි සිට යම් ජන්දදායකයන් ගෙනයාමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු කුලියට දීම, අතමාරුවට දීම, සේවයෙහි යෙදීම, කුලියට ගැනීම, අතමාරුවට ගැනීම හෝ පාවිච්චි කිරීම හෝ කුලියට දීමට අතමාරුවට දීමට, සේවයෙහි යෙදීමට, කුලියට ගැනීමට, අතමාරුවට ගැනීමට හෝ පාවිච්චි කිරීමට වෙන යම් තැනැත්තකුට ආධාර දීමට හා අනුබල දීම නොකළ යුතු අතර දැනුවත් වම මේ උපවගන්තියට පටහැනිව ක්‍රියා කරන තැනැත්තකු නීති විරෝධි ක්‍රියාවකට වරදකරු විය යුතුය.

(4) මේ වගන්තියේ ඉහත සඳහන් වුණු විධිවිධානවල කුමක් සඳහන් වුව ද —

(අ) දන්වීම් නියෝජිතයෙකු වශයෙන් ගෙවීම් ලැබීමට පත්‍රිකා සහ දන්වීම් පත්‍ර ප්‍රදර්ශනය කිරීම ජන්ද හිමියෙකුගේ සාමාන්‍ය ව්‍යාපාරය වූ අවස්ථාවක, ඒ ජන්ද හිමියාහට ගෙවීමක් හෝ ඔහු සමඟ ගිවිසුමක් කරන ලද්දේ සාමාන්‍ය ව්‍යාපාරය අතරතුර වුවහොත් එය මේ වගන්තියේ අර්ථය ඇතුළත නීති විරෝධි ක්‍රියාවක් ලෙස නො සැළකිය යුතුය,

(ආ) මැතිවරණයක දී ජන්ද හිමියන් පදිංචි ස්ථානයක සිට මුහුද, මුහුදෙහි ශාඛාවක් හෝ මුහුදු කඩිත්තක් නැතහොත් ගංගාවක් හරහා නොගොස් තම ජන්ද පොළවල් කරා එළඹිය නොහැකි වූ අවස්ථාවක, ඒ ජන්ද හිමියන්ගේ ජන්දපොළවල් කරා ඔවුන් මුහුදින් ගෙනයාම සඳහා හෝ ඔවුන්ගේ ජන්දපොළවලට ළඟා වීමට ගඟින් එතෙර විය හැකි වනු පිණිස උපක්‍රම යෙදිය හැකි අතර ඒ උපක්‍රම සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණය මේ ආඥාවෙන් ඉඩ දී ඇති උපරිම මුදල් ප්‍රමාණයට අතිරේක වශයෙන් විය හැකි යි.

(ඇ) ලංකා ගමනා ගමන මණ්ඩලයේ හෝ ලංකා දුම්රිය සේවයේ හෝ කොළඹ මහා නගර සභාව මගින් සැපැයෙන යම් මහජන ප්‍රවාහණ සේවයකින් යම් මැතිවරණයකදී යම් තැනැත්තකු තම වියදමින් ජන්ද පොළට හෝ ජන්දපොළෙන් යාම, හෝ ජන්දපොළට හෝ ජන්දපොළෙන් තමා ගෙනයාමේ කාර්යය සඳහා යම් තැනැත්තෙකු විසින් තමාගේ වියදමින් එබඳු සේවයක් පාවිච්චි කිරීම මේ වගන්තියෙහි අර්ථය ඇතුළත නීති විරෝධි ක්‍රියාවක් නොවන ලෙස සැලකිය යුතුය.

(ඈ) යම් මැතිවරණ දිස්ත්‍රික්කයක් සඳහා වූ තේරීම් භාර නිලධරයකු, ඒ දිස්ත්‍රික්කයේ යම් මැතිවරණයක දී ජන්ද විමසීම සිදු කිරීමට ඇති දිනයට දින හතකට පෙර ඔහුට ලැබෙන පරිදි යම් තැනැත්තකු විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් (අපේක්ෂකයකු හෝ ජන්ද නියෝජිතයකු නොවන) වෙන යම් තැනැත්තකු විසින් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට, යම් ශාරීරික දුර්වලකමක් නිසා ජන්දපොළට හෝ ජන්ද පොළින් පයින් හෝ මේ උපවගන්තියෙහි (අ) ඡෙදය සඳහන් යම් මහජන ප්‍රවාහණ සේවයකින් යාමට ඒ තැනැත්තාට නොහැකියයි සැහීමකට පත් වූ අවස්ථාවක, ජන්දපොළට හෝ ජන්දපොළෙන් යාමේ කාර්යය සඳහා යම් වාහනයක්, යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීමට ලිඛිත බලයක් ඒ තේරීම් භාර නිලධරයා විසින් ඒ තැනැත්තාට දිය හැකි අතර ඒ අනුව එසේ තමා ගෙන යාමේ කාර්යය සඳහා ඒ තැනැත්තා විසින් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීම මේ වගන්තියෙහි අර්ථය ඇතුළත නීති විරෝධි ක්‍රියාවක් නොවන ලෙස සැලකිය යුතුය.

5. යම් මැතිවරණ දිස්ත්‍රික්කයක යම් මැතිවරණයක් සම්බන්ධයෙන් පැවැත්වෙන යම් ජන්ද විමසීමක දී (1) වන උපවගන්තියෙහි හෝ (3) වන උපවගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කෙරෙමින් යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කරනු ලබමින් පවතින අවස්ථාවක, යම් පොලිස් නිලධරයකු විසින් ඒ වාහනය, ජල යාත්‍රාව හෝ සතා නවත්වා, තහනමකට ගෙන, පොලිස් ස්ථානයට රැගෙන ගොස් ජන්ද විමසීම අවසාන වනතුරු එහි රඳවා ගත හැකිය.

6. මේ වගන්තියෙහි අර්ථය ඇතුළත වූ නීති විරෝධි ක්‍රියාවක් කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට ප්‍රදේශ අධිකරණයක් විසින්, ඒ ක්‍රියාව කිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු මහ රාජිණිය වහන්සේ වෙත රාජසන්තක කළ යුතු යයි ප්‍රකාශ කරමින් ආඥාවක් කළ හැකිය.

### සේවකයකුට ඡන්දය දීම හැකිවනු පිණිස සේවා යෝජකයා විසින් නිවාඩු දීමේ යුතුකම

**91 වැනි වගන්තිය.**—(1) යම් මැතිවරණයක දී පුද්ගලික ව ගොස් ඡන්දය දීමට හිමි කම් ඇති අන් කිසි තැනැත්තෙකුගේ සේවා යෝජකයකු වූ යම් තැනැත්තකු විසින් ඒ අන් තැනැත්තා ඒ සඳහා ලියවිල්ලකින් වූ ඉල්ලීමක් කරනු ලැබූ විට ඒ මැතිවරණයෙහි දී පුද්ගලිකව ගොස් ඡන්දය දීමට හැකි වීම පිණිස ප්‍රමාණවත් යැයි ඒ තැනැත්තා විසින් සලකනු ලබන පැ හතරකට නොඅඩු කාලයක අඛණ්ඩ කාලසීමාවක් සඳහා ඒ අන් තැනැත්තාට, පඩි නැති නොවන නිවාඩු දිය යුතු ය.

2. (1) වන උපවගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ මසකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙකින් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට, හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම යටත් විය යුතුය.

ලංකාවේ වැලව්වේතයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි